# ඉඩම් හා දේපල ප්‍රතිෂ්ඨාපනය සහ ආර්ථික ප්‍රත්‍යනුකලනය

යුද්ධයෙන් සෘජුව හා වක්‍රාකාරව පීඩාවට පත් කාන්තාවන් සමඟ කෙරෙන සංවාදයන් අතරතුරදී ඉඩම්, දේපල හා ජීවනෝපායයන් අහිමි වීම වඩාත්ම නැවත නැවත මතුවන තේමාවන් ගෙන් එකක් බවට පත්ව තිබේ. විවිධ ජන කණ්ඩායම් ගත්විට එම අහිමිවීම් වල ප්‍රමාණය කාන්තාවන් අතර විවිධාකාරය. තම පවුලේ සාමාජිකයින් මිය යෑම, අතුරුදන් වීම හෝ ආබාධිත වීම වැනි ප්‍රබල අහිමි වීමක් සහ කම්පණයක් වැනි අත්දැකීමකට මුහුණදුන් කාන්තාවන් සිටින පසුබිමක් තුළ දී මේ පිළිබඳව නිතර සඳහන් කොට තිබේ. පවුලේ ආදායම් උපයන්නා පුරුෂයා වන කාන්තාවන් සංස්කෘතිකමය වශයෙන් අර්ථ දක්වන ලද භූමිකාවෙන් පිටතට පැමිණීමෙන් වලක්වා තිබෙන පීතෘ මූලික සමාජයක, මෙවැනි තත්ත්වක් තුළ කාන්තාවන් මත ආදායම් ඉපැයීමේ අතිවිශේෂ පීඩණයක් ද පටවා තිබේ.

උතුරු හා නැගෙනහිර ප්‍රදේශවල යුද්ධයෙන් සෘජුවම පීඩාවට පත් ව සියල්ල අහිමි වූ කාන්තාවන්ට තම ජීවිත යළි ගොඩනැගීම හා ප්‍රත්‍යානුකලනය වීම සඳහා මූලිකවම  අවශ්‍ය වන ඉඩම් හා ජීවත්වීම සඳහා ස්ථානයක් නැවත ලබාදීමකින් තොරව අර්ථාන්විත ජීවිතයක් යළි ආරම්භ කිරීමට නොහැකිය. වක්‍රාකාරයෙන් බලපෑමට ලක්වූ රටේ අනෙකුත් පළාත් වල කාන්තාවන්ට ද, ගෘහමූලිකයාගේ මරණය හෝ ආබාධිත වීම හේතුවෙන් රැකබලාගන්නියන් ලෙස නව ජීවන මාර්ගයකට අනුගත වීමට සිදුවී තිබේ. ස්පර්ෂ කල හැකි ප්‍රතිලාභ උදෙසා කාන්තාවන් තුළ පවතින නිරන්තර සහ ඒකායන ආශාව, ඔවුනට හුරු පුරුදු අඩුවෙන් ස්පර්ෂකල හැකි අවශ්‍යතාවයන් නැවත ලබාගැණීමට දක්වන දැඩි ආශාව පෙන්නුම් කිරීමක් වේ, මක්නිසාද, ඉඩම් ඔවුන්ගේ ජීවන මාර්ගය, සමාජ ජාල සහ ජීවන වෘත්තීයය තෝරාගැනීමට සමග ගැඹුරින් සම්බන්ධවී තිබීමයි.

සියලුම ජන කණ්ඩායම් හරහා, පූර්ණ ප්‍රතිස්ථාපණය සහ ඔවුන්ගේ ජීවන මාර්ග යන් නැවත ආරම්භ කිරීම සම්බන්ධයෙන් කරනු ලබන ඉල්ලීම් සම්බන්ධයෙන් කාන්තාවන් නිසැක සහ ස්ථාවර ය.  කාන්තාවන් විසින් පොදුවේ මුහුණ දෙන සැලකියයුතු ආර්ථික අපහසුතා ඇති සන්ධර්භයක් තුළ මෙම ඉල්ලීම් සිදුකොට තිබේ.



"මෙම රට තුළල තම සැමියා මෙන්ම තම සියලු දේපළ ද අහිමි ව කුඩා දරුවන් සිව් දෙනෙක් සමඟ තනි වූ  කාන්තාවකගේ තත්ත්වය ඔබට සිතාගත හැකිද?

-ත්‍රීකුණාමලයේ දමිළ කාන්තාවක්

*මෙම ප්‍රදේශවල ජීවත් වන ජනයා මුහුණ පාන ප්‍රධානම ගැටලුව වන්නේ ඉහළ යන ජීවන වියදම හා ආර්ථික අපහසුතාවයන්ය. ළමුන්ට තව තවත් අධ්‍යාපනය පහසුකම් අවශ්‍ය වන අතර, තරුණ ප්‍රජාවට විශේෂයෙන්ම රැකියා අවස්ථා අවශ්‍යය. මේවා අදාල කාරණයට සම්බන්ධ විසඳිය යුතු ගැටළු ය.*

- නුවරඑළියේ
දමිළ කාන්තාවක්-










# ප්‍රතිස්ථාපණය පිළිබඳ කාන්තාවන්ගේ අවබෝධය සංක්‍රාන්තික යුක්ති ස්ථම්භ හරහා විහිදී තිබේ

කාන්තාවන් නොකඩවා ඉල්ලා සිටියේ පීඩාවට පත් වූවන්ගෙන්ම තොරතුරු ලබාගෙන ඔවුන්ට සිදුවූ අලාභ හානි පිළිබඳව ඇගයීමක් සිදුකරන ලෙසයි[1]. ප්‍රතිස්ථාපණය හරහා ලැබෙන ස්පර්ශ කල හැකි ප්‍රතිලාභ වලින් කාන්තාවන්ට ප්‍රයෝජනයක් අත්වීමට නම්, මෙම සත්‍යය දැනගැනීම සඳහා වන ආශාව මානසික සුවපත් කිරීමේ කොටසක් ලෙස දැකගත හැකිය. මෙම ප්‍රශ්ණ වල යටිපෙළ වන්නේ, බොහෝ විට ජනතා-වගේ අවශ්‍යතාවන් ඉටු කිරීමට ඇති නොහැකියාව නිසා මෙම කාන්තාවන්ට සිදුවූ අලාභ හානි පිළිබඳව තොරතුරු හිතාමතා ප්‍රමානවත් ලෙස වාර්තාකොට නොමැතිවීම හෝ සත්‍ය වශයෙන්ම ප්‍රතික්ෂේප කිරීම පිළිබඳව පවතින හැඟීම යි. පිරිමින්ට සාපේක්ෂව කාන්තාවන්ට, විශේෂයෙන්ම අවිවාහක කාන්තාවන්ට පොදු කටයුතු සම්බන්ධයෙන් තීරණ ගැනීමට ඇති හැකියාව හා අවස්ථාව ඉතා අල්පය. ඍජුව මෙන්ම වක්‍රාකාරව පීඩාවට පත් ප්‍රදේශවල කාන්තාවන් පිටතට පැමිණ තමන්ට සිදුවූ අලාභ හානියේ ප්‍රමාණය පිළිබඳව තොරතුරු සහතික කිරීමට දැඩි ආශාවක් දැක්වීය. මෙය ගණන් බැලීමේ කොටසක් ලෙස තිබිය යුතු බවට කාන්තාවන් විශ්වාස කිරීම සහ යුද්ධයේ සියලු පැතිකඩවල ප්‍රතිඵලවල තත්ත්වය ගණනය කිරීමේදී මෙයද ඇතුළත් විය යුතු බවට මෙන්ම ඔවුන්ගේ ඉල්ලීම්වල සාධාරණත්වය පෙන්වීමටද ඔවුන් මෙමගින් බලාපොරොත්තු වන බව මෙයින් පැහැදිලි වේ.

සිදුවූ හානි පිළිබඳව සත්‍යය දැන ගැනීමට ඇති මෙම ආශාව, යුක්තිය හා වගවීම සඳහා ද ඉතා වැදගත් ය. ඉඩම් හා දේපළ අහිමි වීම ඉතා බරපතල අසාධාරණයක් ලෙස සැලකෙන අතර අපරාධවලට දඬුවම් දීමෙන් පමණක් අසාධාරණයට ලක් වූ-වන්ට සාධාරණය ඉටු නොවේ. සැබෑ වින්දිතයින් හඳුනාගැනීම, ඉඩම්, දේපල සහ/හෝ ජීවනෝපායයන් සැබෑ අයිතිකරුවන්ට නැවත ලබා දීම6, හෝ වෙනත් ආකාරයේ ප්‍රතිස්ථාපණයන් ලබා දීම7, සහ පීඩාවට පත්වූවන්ට සහන සැලසීම හා සේවා සැපයීම තුළින් සහාය දැක්වීමට බැඳී සිටින බව පිළිගැනීමද ඉතා වැදගත් වේ. මෙමගින් අවධාරණය වන තවත් කරුණක් නම්, සිදු වී ඇති අලාභ හානි පිළිබඳව රජය විසින් පරීක්ෂණයට ලක් නොකරන හා තොරතුරු සහතික නොකරන අවස්ථාවලදී එම හානි සඳහා පූර්ණ වන්දි ලබාගැනීම පිළිබඳව සහතික විය නොහැකි අතර, කුමක් සඳහා වන්දි ලබා දීම සිදු කළ යුතුද යන්න තීරණය කිරීමද සිදු කළ නොහැකිය. ලබාදෙන වන්දි සාධාරණ වීමටනම් ඒවා ප්‍රමාණවත් මෙන්ම පක්ෂග්‍රාහී නොවන හා සිදුවී ඇති හානිවලට සමානුපාතික විය යුතු බවට බොහෝ කාන්තාවන් අවධාරණය කර ඇත. සිංහල කාන්තාවන්ද මෙම මතයම ඉදිරිපත් කල අතර, ඔවුන් ප්‍රකාශ කර සිටියේ ඔවුන්ට ලැබුණ මුදල් අධාර ප්‍රමාණවත් නොවන බවයි.

කාන්තාවන් සත්‍යය සොයමින් සිටියිඃ

- ඔවුන්ගේ හානි පිළිබඳව පුළුල් ඇගැයීමක්[8]
- අහිමි වූවන්ගෙන් ඍජුවම සාක්ෂි හා තොරතුරු ලබා ගැනීම
- කාන්තාවන්ගේ අත්දැකීම්වලට සහ හඬට ගරු කරන යාන්ත්‍රණයන් තුළින්

හානි පිළිබඳව සත්‍යය වැදගත් වන්නේ ඇයිඃ

- කාන්තාවන්ට සිදු වූ අලාභහානි ගණන් බලා නොමැත[9]
- ඔවුන්ගේ අහිමි වීම් හා ඒවායේ ප්‍රමාණය සත්‍ය වශයෙන් කියතොත් නොසලකා හැර ඇත[10]
- පීඩාවට පත් වූවන්ගේ අවශ්‍යතා ඉටු කිරීමට රජය කැප වී නොමැති බව පෙනී යාම[11]
- මේ ගැටලුව පිළිබඳව ගන්නා තීරණවලදී ර ජ ය ට බලපෑම් කිරීමට රජය තුළ කාන්තාවන් නොමැති වීම නිසා, රජයේ තීරණ ගැනීමේ ක්‍රියාවලියේ විනිවිදභාවය අත්‍යවශ්‍යය
- කාන්තාවන්ට සිදු වූ අලාභහානිවල ප්‍රමාණය පෙන්වාදීම සඳහා විශ්වාසදායී තොරතුරු අවශ්‍යය
- මේ ආකාරයෙන් පමණක් කාන්තාවන්ගේ ඉල්ලීම්වල නීත්‍යානුකූල භාවය සහ සාධාරණභාවය දැක ගත හැකි වීම
- භෞතික හානි පිළිබඳව කෙරෙන මෙම ගණනය කිරීම, යුද්ධයේ සියලු පැති සොයා බලන ගනණය කිරීමේ කොටසක් ලෙස සිදු විය යුතු වීම
- ප්‍රතිස්ථාපණය කිරීමෙන් භෞතික වශයෙන් ලැබෙන ප්‍රතිලාභ මෙම කාන්තාවන්ට ලැබීමට නම්, ඒය මා-නසික වශයෙන් සුවපත් කිරීමේ ක්‍රියාවලියක අංගයක් විය යුතුය[12]

සියලු ජනවර්ග නියෝජනය කරන කාන්තාවන් තමන්ට සිදුවූ අලාභ හානි පිළිගයුතු බවත් ඔවුන්ගේ ඉල්ලීම්

නීත්‍යානුකූල කරන ලෙසත් ඉල්ලා සිටින අතර, මෙය සිදුකල යුතු ආකාරය පිළිබඳව ඔවුන් අතර වෙනස්කම් පවතියි. ඔවුන් සමාන සැලකිලි හා සමාන අවස්ථා අතරද, සමාන හා අපක්ෂපාතී හානිපූරණය අතර වෙනස්කම්වලට යටින් සහාය දක්වයි. අලාභහානි සම්බන්ධයෙන් ගත් කල්හී වර්ගීකරණයක් තිබෙන අතර, ඒ හා සම්බන්ධ සංවේදීතාවය වෙත කාන්තාවන්ගේ ගැටීමක් සිදු වේ[13]. යුද්ධය නිසා වැන්දඹු වූවන්ගේ තත්ත්වය දෙමළ දේශපාලඥයන්, විශේෂයෙන්ම රජයේ සහයෝගය නොලබන කාන්තාවන්, මෙන්ම ආබාධිත සෙබළුන්ගේ භාර්යාවන්15 සහ යුද්ධයෙන් ආබාධිත වූ අනෙකුත් පුද්ගලයින් විසින්[16] මතු කොට දක්වා තිබේ.

න කණ්ඩායම් අතර සාධාරණත්වය ඉටු වීම සඳහා සුදුසුකම් ඇතැයි යන හැඟීම සඳහා ප්‍රතිස්ථාපනය මගින් දායක වීමට නම්, පූර්ණ හා විනිවිදභාවයෙන් යුතු ගණට් බැලීම් අවශ්‍ය වේ. කාන්තාවන් සමඟ කරන සාකච්ඡා තුළින් හැඟීයන ආකාරයට, මෙම ක්‍රියාවලිය අපක්ෂපාතී හා විනිවිදභාවයකින් යුතු විය යුතු අතරම ඒ බව එහි ප්‍රධාන ප්‍රතිලාභීන්ට[17] අවබෝධ විය යුතුය. එසේ නොමැති වූ විට එවැනි ක්‍රියාදාමයක සදාචාර සම්පන්නබව හා අරමුණු පිළිබඳව ගැටලුකාරී තත්ත්වයක් ඇති විය හැකි අතර එය ලඟා කරගැනීමටද නොහැකි විය හැකිය.

කාන්තාවන් ද යුක්තිය හා වගවීමද සොයයිඃ

■ තම පවුලේ දිවි පෙවෙත රකින්නන් වන තම ආදරණීයන් අහිමි වීම, හා තමන් සතු ඉඩම් හා දේපල තමන්ගෙන් බැහැරට ලබාගෙන තිබීම මහත් අසාධාරණයකි.

■ පීඩාවට පත් වූවන්ට යුක්තිය ඉටු කිරීම අපරාධකරුවන්ට දඬුවම් දීම තුළ පමණක් නොව රජය මගින් ගන්නා ක්‍රියාමාර්ග තුළ ද රැඳී පවතියිඃ

- අහිමිවීම් සිදු වූවන් හඳුනාගැනීම
- අහිමි වූවන්ට උපකාර කිරීමේ වගකීම පිළිගැනීම සහ ඔවුන් වෙත පැමිණීම
- රජය විසින් නැවත ලබාදිය යුතු බව පිළිගැනීම සහ ඒසේ කිරීම සඳහා වගවීම
- තම හඬ අවදි කිරීම නිසා අපකීර්තියට හෝ භය ගැන්වීම්වලට ලක්වීමෙන් කාන්තාවන් ආරක්ෂා කිරීම
- හානිවලට සමානුපාතික වන ලෙස වන්දි ප්‍රදානය කිරීම තහවුරු කිරීම පිණිස, ප්‍රතිස්ථාපනය පිළිබඳව තීරණ ගැනීම සඳහා අපක්ෂපාතී ක්‍රියාවලියක් ස්ථාපණය කිරීම
- ඉඩම්, දේපල හා/හෝ ජීවනෝපායන් නීත්‍යානුකූල බලය ලත් හිමිකරුවන්ට නැවත ලබාදීම[18]
- එවැනි වන්දියක් ලබාදීමට අපොහොසත් වන අවස්ථාවල වෙනත් ආකාරයකට ආධාර කිරීම[19]
- පීඩාවට පත් වූවන්ට තම සුපුරුදු ජීවිත නැවත ආරම්භ කිරීමට අවශ්‍ය සහයක සේවා සැපයීම

ප්‍රතිස්ථාපණය කිරීමේදී සමාන සැලකිලි හා සමාන අවස්ථා පිළිබඳව පොදු අවබෝධයක් ප්‍රචලිත කිරීමේ අවශ්‍යතාවයක් ඇතඃ

■ අහිමිවීම් සම්බන්ධයෙන් ගත් කල්හී ඒවා වර්ගීකරණයක් සිදුකරන අතර, එය පිළිගත යුතුය[20]

■ දෙමළ හා සිංහල කාන්තාවන් අතර යුද්ධයේ අත්දැකීම් සම්බන්ධයෙන් වෙනස්කම් ඇත

■ හිමිතම් සම්බන්ධයෙන් වෙනස්කම් ඇත- රණවිරු බිරියන්ට හා පවුල්වල අයට විශ්‍රාම වැටුප් සහ අනෙකුත් ප්‍රතිලාභ හිමි වන නමුත්, දෙමළ පවුල්වලට හිමි වන්නේ නැත

■ අහිමිවීම් ගණනය කරන ආකාරය වැදගත් වේ- එම ක්‍රියාවලිය අපක්ෂපාතී හා විනිවිදභාවයෙන් තිබීම පමණක් නොව, ඒ බව එහි ප්‍රාථමික ප්‍රතිලාභීන්ට දකගත හැකි විය යුතුය[21]

■ සමහර කණ්ඩායම්වලට වැඩි අවදානම් අවස්ථාවන්ට මුහුණ දීමට සිදු වූ අතර වන්දි ලබාදීමේදී ඒ පිළිබඳවද අවධානය යොමු කළ යුතුය

■ යුද්ධය නිසා වැන්දඹු වී රාජ්‍ය ආධාර නොමැතිව ජීවත්වන්නන් හා ඔවුන්ගේ දරුවන්ට විශේෂ අවධානය ලබාදිය යුතුය[22]

■ යුද්ධය නිසා ආබාධිත වූවන්ට විශේෂ අවධානය ලබාදිය යුතුය[23]

■ යුද්ධය නිසා ආබාධිත වූ සොල්දාදුවන්ටද, ඔවුනගේ පවුල්වලට ලබාදෙන මුදල් ආධාර ප්‍රමාණවත් නොවන විට24 හා ඒවා නිසි අයුරින් සන්නිවේදනය නොකොට ඇති අවස්ථාවන්25 පිළිබඳව විශේෂ අවධානයන් යොමු කළ යුතුය. වර්තමාන තත්ත්වයට විසඳුම් ලෙස වඩා පුළුල් වූ වෙනස්කම් සමඟ සිදුවන ආර්ථික ප්‍රතිසංකලනයකට හා වන්දි ලබාදීමේ වැඩපිළිවෙලක් සඳහාද කාන්තාවන් තම කැමැත්ත පළ කළහ. එවැනි වෙනස්කම් හේතුවෙන් කාන්තාවන් දිගින් දිගටම ආර්ථිකමය වශයෙන් සමාජයෙන් දුරස්ථ කොට නොතැබීම තහවුරු කරන අතර, එමගින් යුද්ධයේ මූල බීජයකට ද විසඳුම් ලබාදෙනු ඇත26. ඔවුන් එමගින් නැවත යුද්ධයක් ඇති වීම තහවුරු කරන අතර, අභ්‍යන්තර වශයෙන් අවතැන් වූ කාන්තාවන්ට ස්ථිර පදිංචිය සඳහා වන මාවතේ අවසාන විසඳුමක් ද තහවුරු කරනු ඇත. මෙයට ආයතනික, වැඩසටහන් ප්‍රතිපත්තිමය වෙනස්කම් අයත්වනු ඇති අතර, විශේෂයෙන්ම සුදහන් කල යුත්තේ රැකියාවන් සම්බන්ධ ක්ෂේත්‍ර වල, විශේෂයෙන්ම සංක්‍රමණය වීම27, වෘත්තීය පුහුණුව, මූල්‍යකරණය28, නෛතික උපකාර ලබා ගැනීම29, සේවා පහසුකම් ලබා ගැනීම30,

**කොපමණ කාන්තාවන් ප්‍රමාණයක් පීඩාවට පත් වීද? දේපල හානිවීම්වල ප්‍රමාණය හා ඒ හා සම්බන්ධ දත්ත මොනවාද? අධ්‍යාපනයට බාධා වූයේ කෙසේද? ආර්ථිකමය හානි මොනවාද? ප්‍රවාහනයට පැමිණි බාධා හා ඊට හේතු මොනවාද? මුස්ලිම් ජනතාවගේ ඉඩම් අත්කර ගැනීම, පල්ලිවලට හා ඔවුන්ගේ දේපලවලට වූ හානි මොනවාද?**

**- අම්පාර ප්‍රදේශයේ මුස්ලිම් කාන්තාවන්-**

*දිස්ත්‍රික්කයේ සිටින බහුතරයක් කාන්තාවන් නුගත් හා අඩු ආදායම්ලාභී පවුල්වල අයයි. ඔවුන්ට හිමි සමෘද්ධි, යුද්ධයෙන් පීඩාවට පත්වූවන්ට ලබාදෙන ආධාර, සුනාමි ආධාර වැනි ප්‍රතිලාභ ඔවුන්ට නොලැබුන අතර ඒවා ලබාගන්නා ආකාරය පිළිබඳවද ඔවුන් දැන සිටියේ නැත. බොහෝවිට්ම වරප්‍රසාද නොලත් අය වූයේ කාන්තාවන්ය. රජයේ ආධාර ලැබීමට සුදුසුසන්ට ඒවා ලැබෙන්නේ නැත. නිලධාරීන් විසින් ඔවුන්ට විවිධ නිදහසට කරුණු පවසයි.*

*-අම්පාර ප්‍රදේශයේ ප්‍රජා නායකයෙක් -*

ද්විභාෂා හා ත්‍රෛභාෂා සහය 30 හා හමුදාව හා වෙනත් උසස් නිලධාරීන් විසින් ඉඩම් අත්පත් කර ගැනීම හා භාවිතා කිරීම නැවැත්වීම අඩංගු වනු ඇත[32.]



මෙම වෙනස්කම් අඩු පහසුකම් සහිත පුද්ගලයින් (ළමුන්, වැන්දඹුවන්, ආබාධිතවූවන්, වැඩිහිටියන්, අතිශය දුප්පත්)[33] හා පොදුවේ යුද්ධයෙන් පීඩාවට පත් සියලු කාන්තාවන් සවිබල ගැන්වීමේ මාර්ග ලෙස දැකගත හැකිය. කෙසේ නමුත් මෙම කාන්තාවන් ජීවත් වන පීතෘමූලික සමාජයේ මුල් බැස ඇති සමාජ සම්මතයන් හා ව්‍යුහයන් ආමන්ත්‍රණය කිරීමකින් තොරව ඔවුන් සවිබල ගැන්වීම කළ පහසු නොවනු ඇත[34.]

කාන්තාවන්ගේ තත්ත්වයන්ට පුළුල් වූ වෙනස්කම් අවශ්‍යයඃ

■ අර්ථික ප්‍රතිසංකලනයට මෙන්ම ස්ථිර නැවත පදිංචි කිරීමේ මාවතනට ප්‍රතිස්ථාපනය හේතු විය යුතුය

■ යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් සමාජයේ ආර්ථික කටයුතුවලින් වඩාත්ම බැහැර කොට සිටින පිරිස අතර වන බව සැලකිල්ලට ගත යුතුය

■ වඩාත් අවධානමට ලක්වූවන් ඊට ඇතුළත්යඃ ළමුන්, වැන්දඹුවන්, ආබාධිතවූවන්, වැඩිහිටියන්, අතිශය දුප්පත් පුද්ගලයින් දැක්විය හැකිය35



■ ඔවුන් ඉදිරියටත් සමාජයෙන් බැහැර කිරීම වැළැක්වීම තහවුරු කිරීමට නම්, යුද්ධයේ මූල බීජයන්ට විසඳුම් සෙවිය යුතුය36

■ පිරිමින් විසින් තම සමාජයන් තුළ කාන්තාවන්ගේ නිදහස මත පනවා ඇති සීමා මායිම් හඳුනාගැනීම සහ මුලිනුපුටා දැමීම ඉතා වැදගත් වේ. සමාජයේ දක්නට ඇති එවැනි සීමාවන් අතර37ඃ ද කාන්තාවන්ට රැකියාවක් තෝරා ගැනීමේදී සහ සේවය කැන ස්ථානයේ දී, පිළිග ැනීම හා ආරක්ෂාව නොලැබීම

❍ ඔවුන්ගේ මූල්‍යමය කටයුතු පාලනය කිරීමට අවස්ථාව නොලැබීම

❍ බබසෘක හා අතුරුදහන්වූවන් පිළිබඳ කමිටුව ආදි ව්‍යුහයන් තුළ කාන්තා නියෝජනය අල්ප වන නිසා, තීරණ ගැනීමේදී කාන්තා සහභාගීත්වයක් නොමැති වීම

❍ පවුල තුළ කාන්තාවන්ට සාම්ප්‍රදායිකව හිමිව ඇති ඒකාකාරී භූමිකාවන් හා කාන්තාවන්ට පමණක්ම සීමා වූ කාර්යභාරයන් බිඳ දැමීමට උගෙනීම පිණිස කාන්තා අයිතීන් සහ පොදුවේ අධ්‍යාපණයන් නොමැති කම

❍ ඔවුන් විසින්ම බලය තහවුරු කරගත හැකි සහයෝගී පරිසරයක් නොමැති වීම



■ දේපල හා වස්තුව අහිමි වූ කාන්තාවන් සඳහා අවසාන විසඳුම් මාලාවක් ලබා දීමට නම් පහත සියලු අංශවල ප්‍රතිපත්තිමය, ආයතනික මෙන්ම ඒ සම්බන්ධ වැඩසටහන්වලද වෙනස්කම් සිදු විය යුතුයඃ

❍ හමුදාව හා වෙනත් උසස් නිලධාරීන් විසින් ඉඩම් අත්පත් කර ගැනීම හා භාවිතා කිරීම38



❍ රැකියා අවස්ථා, විශේෂයෙන්ම සංක්‍රමණය[39]

❍ වෘත්තීය පුහුණුව

❍ මූල්‍යමකරණය පහසුවෙන් ලබාගත හැකි වීම[40]

❍ නීති ආධාර[41]

❍ සෞඛ්‍යය හා අධ්‍යාපනය වැනි සේවා පහසුකම්, විශේෂයෙන්ම ඔවුන්ගේ දරුවන් සඳහා පහසුවෙන් ලබාගත හැකි වීම [42]

❍ සේවා සැපයීමේ දී ද්විභාෂා හා ත්‍රෛභාෂා භාවිතා කිරීම[43]

■ මෙම පුළුල් වූ වෙනස්කම් කාන්තාවන් සවිබල ගැන්වීමට මාවත් විය යුතුය




සිංහල හා දෙමළ ස්ත්‍රී පුරුෂ දෙපාර්ශයම සැළකිල්ලක් දැක්වූ සහ අවධාරණය කර සිටි කාරණාවක් වූයේ ප්‍රතිස්ථාපණ ක්‍රියාවලිය් දී ආයතනික ප්‍රතිසංස්කරණ වල දී රජයේ සම්පත්

**ඇය ජීවත් වූ සමාජයේ මේ රැකියාව ගැහැණියකට නුසුදුසු ලෙස සැලකුවත්, කිසිත් කර කියාගත නොහැකි වූ තැන ඇය කුඩා හෝටලයක පිරිසිදුකරන්නිය-ක් ලෙස රැකියාවක් සොයා ගත්තාය. හෝටල් කළමනාකරණය විසින් ඇයට කරුණාවෙන් හා ගෞරවයෙන් සැලකුවේය. සාමාන්‍ය ජීවිතයක් ගත කිරීම සඳහා එයින් ලැබූ ආදායම ඇයට ප්‍රමාණවත් විය. නමුත් ඇගේ දියණියගේ විවාහය වන්නට පෙර ඇය ඇගේ රැකියාවෙන් ඉවත් වූවාය. එයට හේතු වූයේ ඇය එවැනි රැකියාවක නිරත වීම සම්බන්ධයෙන් මනාලයාගේ පවුලෙන් අකමැත්ත ප්‍රකාශ කිරීමයි.**

**– ත්‍රිකුණාමලයේ දෙමළ කාන්තාවක් –**





**බිම්මට්ටමේ කාන්තාවන්ගේ ගැටලුවලට විසඳුම් සෙවීම සඳහා පොලිසිය හා නීති ආධාර කොමිෂන් සභාව හා සම්බන්ධව කටයුතු කරන කාන්තා සංවිධාන ස්ථාපිත කළ යුතුය.**
**- මිශ්‍ර සම්භවයක් ඇති නුවරඑළියේ කාන්තාවන් -**

බෙදාහැරීමේ යාන්ත්‍රණය සහ එය නිසි කලට සිදු කිරීම පිළිබඳව යි. එවන් සැලකිළි මත් වූ කාරණා සිවිල් සමාජයට ප්‍රතිලාභ ගෙන දීමේ[44] සහ අයවැයෙන් සාධාරණ ලෙස ප්‍රතිපාදන[45] වෙන් කිරීමේ අවශ්‍යතාවය ආවරණය කරයි.

ආයතනික වෙනස්කම් ඉටු කිරීම සඳහා රාජ්‍ය ආයතන මත විශ්වාසය තැබිය හැකිද යන්න පිළිබඳව කාන්තාවන්ගේ අවධානය

- අලාභ හානි වලට සරිලන ලෙස අයවැයෙන් සාධාරණ ලෙස ප්‍රතිපාදන වෙන් කිරීම[46]
- කලට වේලාවට කටයුතු කිරීම
- සුදුසු පරිදි සියලු තොරතුරු ලේඛනගත කිරීම සඳහා පහසුකම් සැපයීම[47]
- ව්‍යාජ තොරතුරු හා වංචනික මාර්ග වලින් හානිපූර්ණයන් ලබා නොගැනීම තහවුරු කිරීම[48]
- ක්‍රියාවලිය තුළ අල්ලස් දීමක් අවශ්‍යය නොවීම සහ දූෂණ නොමැති වීම.[49]
- පරිත්‍යාග ශීලීන්ගේ ආධාර දේශපාලඥයන්ගේ පවුල්වලට, හිත මිත්‍රාදීන්ට හා ආධාරකරුවන්ට[50] ලැබීම වැළැක්වීම
- දේශපාලන පක්ෂග්‍රාහීත්වය මත තීරණවලට එළඹීම වැළැක්වීම[51]
- සංවර්ධන කටයුතු හරහා දේශපාලඥයන්ට නොව සිවිල් සමාජයට වාසි සහගත වන ලෙස සිදු කිරීම[52]

වන්දි ලබා දීම හා කාන්තාවන් සවිබල ගැන්වීම හා නැවතත් එවැනි අවස්ථාවන් උද්ගත නොවීම සඳහා කාන්තාවන් විසින් ආයතනික වෙනස්කම් සඳහා ඉදිරිපත් කරන ලද යෝජනා පහත සඳහන් නිර්දේශයන් තුළ අන්තර්ගත වේ.

## ප්‍රතිපත්ති රාමුව

2016 මාර්තු මාසයේදී බන්ධනාගාර ප්‍රතිසංස්කරණ, පුනරුත්ථාපන, නැවත පදිංචි කිරීම හා හින්දු ආගමික කටයුතු අමාත්‍යාංශය (නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශය) විසින් ගැටුම් හේතුවෙන් සිදු වූ අවතැන්වීම් සඳහා කල්පවත්නා විසඳුම් පිළිබඳ ජාතික ප්‍රතිපත්තිය ඉදිරිපත් කරන ලදී. අවතැන් වූ ජන කණ්ඩායම් සමඟ පවත්වන ලද සාකච්ඡාවලින් අනතුරුව ජාත්‍යන්තර ප්‍රමිතීන්ට අනුකූලව හා ස්ත්‍රී පුරුෂ සමාජභාවයන් සැලකිල්ලට ගනිමින් පරිපූර්ණ ලෙස ඉදිරිපත් කරන ලද මෙම ප්‍රතිපත්තිය තුළින් කාන්තාවන්ගේ හිමිකම් නැවත ලබා දීම හා නව සංවිධාන ව්‍යුහයන් නිර්මාණය ආදිය තුළින් ඔවුන්ව ප්‍රතිසංකලනය කිරීමේ අවශ්‍යතා සපුරාලීම සඳහා කටයුතු කිරීමට රජයට විධිමත් සැලැස්මක් සපයන ලදී.

2016 අගෝස්තු මාසයේ දී ශ්‍රී ලංකා පාර්ලිමේන්තුව විසින් ප්‍රථම තොරතුරු දැන ගැනීමේ පනත සම්මත කරන ලදී. මෙම පනත මගින්, මහජන ආයතන සතු හා එම ආයතන මගින් නියාමනය වන යම් යම් තොරතුරු යම් ව්‍යතිරේඛයන් සහිතව ලබාගැනීම සඳහා සෑම පුරවැසියෙකුටම අයිතිය ලබාදෙන ලදී. අතුරුදහන් වූ තැනැත්තන් පිළිබඳ කාර්යාලය පිහිටුවීමේ පනතෙහි නියමයන් මේ පනතට යටත් නොවන අතර, යුද්ධයෙන් අහිමි වූ ඉඩම් හා දේපල පිළිබඳ තොරතුරු එකතු කිරීමට හා ඒවා ප්‍රකාශ කිරීමට රජයට කිසිදු බාධාවන් හෝ සීමාවන් මෙමගින් ඇති නොවේ. ඉඩම් අත්පත් කරගැනීම, දේපල හානි හා වන්දි ලබාගැනීමේ විධි හා ක්‍රියාවලීන් පිළිබඳ අවශ්‍ය තොරතුරු හෝ කිසියම් ලේඛනයක් ඉල්ලා සිටීම සඳහා කාන්තාවන් සවිබල ගැන්වීමට මෙම පනතෙහි ඇතුළත් නියමයන් යොදා ගත හැකිය.

## කාන්තා ඉල්ලීම් හා ඒ සඳහා රජයේ කැපවීම තුලනය

කාන්තාවන් සමඟ කරන ලද සාකච්ඡා වල ප්‍රථිඵල හා නිර්දේශයන් මත පදනම්ව සම්පාදනය කළ ප්‍රතිපත්ති සංශෝදනය පිළිබඳ කරුණු පහත සඳහන් පරිදි වේ.

**නිර්දේශඃ**

කාන්තාවන්ගේ අදහස් හා අත්දැකීම් මත පදනම්ව ඔවුන්ගේ ගැටලුවලට වැදගත් වන වෙනස්කම් හා ප්‍රතිපත්තිමය පරිසරය සඳහා ඔවුන් විසින්ම ඉදිරිපත් කරන ලද යෝජනා හා නිර්දේශයන් පහත දැක්වේ.

- ශ්‍රී ලංකාවේ සංක්‍රාන්තික යුක්ති සංධර්භය තුළ යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන්ට වන්දි ලබා දීම හා ආර්ථික ප්‍රතිසංකලනය සඳහා රජය හා සිවිල් ක්‍රියාකාරීන් විසින් කඩිනම් ක්‍රියාමාර්ග ගත යුතුය.

.

- යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන් තමන්ට හිමි අයිතීන් පිළිබඳව දැනුවත් විය යුතුය. රජයේ වගකීම වන්නේ ප්‍රතිස්ථාපණය හා ආර්ථික ප්‍රතිසංකලනයට අදාල අයිතීන් ඉටුකර ගැනීම සඳහා ප්‍රමුඛත්වය දීම යි.

- නැවත පදිංචි කිරීමේ අමාත්‍යාංශයේ ගැටුම් හේතුවෙන් සිදු වූ අවතැන්වීම් සඳහා කල්පවත්නා විසඳුම් පිළිබඳ ප්‍රතිපත්තිය සියලු භාෂාවලින් ප්‍රකාශයට පත් කළ යුතු අතර, එය යුද්ධයෙන් පීඩාවට පත් ව අභ්‍යන්තරව අවතැන් වූවන්, අමාත්‍යාංශ, රාජ්‍ය නොවන සේවා සංවිධාන, අන්තර් රාජ්‍ය සංවිධාන, පරිත්‍යාග ශීලීන්, ජාතික හා ජාත්‍යන්තර මට්ටමේ ප්‍රතිපත්ති සම්පාදකයන් අතර බෙදා හැරිය යුතුය.



- වන්දි ලැබිය යුත්තන් හඳුනාගැනීම, ඔවුන්ගේ අලාභ හානි ගණනය කිරීම, වන්දි නිසි ලෙස බෙදීයාම සහතික කිරීම සඳහා ස්වාධීන හා විනිවිද භාවයෙන් යුත් ක්‍රියාවලියක් පිහිටුවිය යුතුය. මෙම ක්‍රියාවලියේ ප්‍රධාන භූමිකාවක් කාන්තාවන්ට හිමි විය යුතුය.54

- දිස්ත්‍රික්ක, පළාත් හා ජාතික මට්ටම්වල තීරණ ගැනීම්වලට සහභාගි වීමට කාන්තා සංවිධාන ඇති කිරීම හා දැනට බල පැවැත්වෙන එවැනි සංවිධාන ශක්තිමත් කළ යුතුය. පීඩාවට පත් වූවන්ට සහාය වන සංවිධාන ඇති කිරීමෙන් කාන්තා අදහස්වලට ගෞරවයක් මෙන්ම, කාන්තාවන්ට නායකත්වය ගෙන කටයුතු කිරීමට ධෛර්යමත් කිරීමද සිදු වේ.55

- තොරතුරු ලේඛනගත කිරීම තුළින් යම්කිසි ප්‍රදේශයක හෝ ඔවුන්ගේ ඉඩම් සම්බන්ධව කාන්තාවන්ට තමන්ට අහිමි වූ වරප්‍රසාද නීත්‍යානුකූලව නැවත ලබාගැනීමට අවස්ථාව සැලසෙයි.

- රැකියා හා ජීවනෝපාය මාර්ගයන් නැවත අරම්භ නිරීම සඳහා අවශ්‍ය යටිතල පහසුකම් සැපයිය යුතු අතර, එවැනි සංවර්ධන කටයුතු සිදු කිරීමේදී යුද්ධයෙන් පීඩාවට පත් කාන්තාවන්ද සහභාගී කරගත යුතුය. එම සංවර්ධන කටයුතු ලෙස ඉඩම් හා නිවාස ව්‍යාපෘති, පාසල්, රෝහල්, පූජනීය ස්ථාන, ප්‍රවාහනය, අපද්‍රව්‍ය බැහැර කිරීම, හා අලි මිනිස් ගැටුම විසඳීම ආදිය දැක්විය හැකිය.



- සැලකිය යුතු ආදායමක් ලැබෙන රැකියා අවස්ථා ලබා දිය යුතු අතර, රජයේ රැකියා දීමේදී ප්‍රමුඛත්වය දීම, වෙළඳපළට පිවිසීමට අවස්ථා සලසා දීම හා ස්වයං රැකියා සඳහා සහාය ලබා දීම වැදගත් වේ.

**ප්‍රතිලාභ හා සහන අපක්ෂපාතී හා සුදුසු පරිදි ලබා දිය යුතුයිඃ එම ක්‍රියාවලිය සියලු දෙනාටම පොදු විය යුතුය. අල්ලස් හා දූෂණ ගැන අපට අත්දැකීම් තිබේ.**

**- වවුනියාවේ දෙමළ කාන්තාවන්-**



- කාන්තාවන්ට රැකියා පාදක කුසලතා පුහුණු වීමට, හා ව්‍යාපාරයක් ආරම්භ කිරීමට අවශ්‍ය මූලික දැනුම හා උපකරණ ලබාදීම සඳහා වෘත්තීය පුහුණු වැඩසටහන් ආරම්භ කොට ඒවා හැදෑරීම සඳහා කාන්තාවන්ට වැඩි අවස්ථා ලබා දිය යුතුය.
- ණය බරින් නිදහස් වී ස්ථාවර වීම සඳහා කාන්තාවන්ට විශේෂ ණය පහසුකම් සලසාදීම.

1 අම්පාර, නුවරඑළිය
2 මහනුවර, නුවරඑළිය, හම්බන්තොට
3 අම්පාර, නුවරඑළිය, හම්බන්තොට, වවුනියාව, මන්නාරම
4 ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පුත්තලම
5 මන්නාරම දමිළ කණ්ඩායම
6 හම්බන්තොට, වවුනියාව, ත්‍රිකුණාමලය, පුත්තලම, මන්නාරම
7 හම්බන්තොට
8 අම්පාර, නුවරඑළිය
9 අම්පාර, නුවරඑළිය, හම්බන්තොට, වවුනියාව, මන්නාරම
10 ගාල්ල, ත්‍රිකුණාමලය, හම්බන්තොට, පුත්තලම
11 මන්නාරම දමිළ කණ්ඩායම
12 මහනුවර, නුවරඑළිය, හම්බන්තොට
13 අම්පාර, ත්‍රිකුණාමලය, වවුනියාව
14 අම්පාර, මන්නාරම, මහනුවර, වවුනියාව, ගාල්ල
15 හම්බන්තොට, පුත්තලම
16 පුත්තලම, ත්‍රිකුණාමලය, වවුනියාව
17 හම්බන්තොට, ගාල්ල, නුවරඑළිය, පුත්තලම, ත්‍රිකුණාමලය, වවුනියාව
18 හම්බන්තොට, වවුනියාව, ත්‍රිකුණාමලය, පුත්තලම, මන්නාරම
19 හම්බන්තොට
20 අම්පාර, ත්‍රිකුණාමලය, වවුනියාව
21 හම්බන්තොට, ගාල්ල, නුවරඑළිය, පුත්තලම, ත්‍රිකුණාමලය, වවුනියාව
22 අම්පාර, මන්නාරම, මහනුවර, වවුනියාව, ගාල්ල
23 පුත්තලම, ත්‍රිකුණාමලය, වවුනියාව
24 හම්බන්තොට, පුත්තලම
25 ගාල්ල
26 අම්පාර
27 නුවරඑළිය
28 ත්‍රිකුණාමලය, වවුනියාව
29 හම්බන්තොට
30 හම්බන්තොට, ත්‍රිකුණාමලය
31 සියලුදිස්ත්‍රික්ක
32 අම්පාර, මන්නාරම
33 හම්බන්තොටල නුවරඑළියල පුත්තලමල වවුනියාවල මහනුවර,ත්‍රිකුණාමලය
34 සියලුදිස්ත්‍රික්ක
35 හම්බන්තොටල නුවරඑළියල පුත්තලමල වවුනියාවල මහනුවර,ත්‍රිකුණාමලය
36 අම්පාර
37 සියලුදිස්ත්‍රික්ක
38 අම්පාර, මන්නාරම
29 නුවරඑළිය
40 ත්‍රිකුණාමලය, වවුනියාව
41 හම්බන්තොටල අම්පාර
42 හම්බන්තොට, ත්‍රිකුණාමලය
43 සියලුදිස්ත්‍රික්ක
44 නුවරඑළියල මහනුවරල ත්‍රිකුණාමලය
45 අම්පාර, මන්නාරම
46 අම්පාර, මන්නාරම
47 අම්පාර,ගාල්ල , පුත්තලම
48 නුවරඑළිය
49 වවුනියාව
50 අම්පාර,ගාල්ල, මහනුවර, වවුනියාව
51 මහනුවර
52 නුවරඑළියල මහනුවරල ත්‍රිකුණාමලය
53 මහනුවර
54 නුවරඑළිය
55 ත්‍රිකුණාමලයල ,ගාල්ල, වවුනියාව

Briefing Paper No- 4, December 2016
Published by: National Peace Council- 12/14 Purana Vihara road,
Colombo 6, Sri Lanka.
Tel:+94 112 818 344, 0112 854 127 Fax: +94 112 819 064
Web: www.peace-srilanka.org

All rights reserved. Material from this publication maybe used with due credit to the National Peace Council.
Thanking Ms Zahabia Afgarali Adamaly for drafting the Briefing Paper.

Supported by

FOKUS
FORUM FOR WOMEN AND DEVELOPMENT